ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය / எனது இல. / My No. | | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2021.05.28 |
|---|---|---|---|---|---|

වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

<u>**කොවිඩ් - 19 එන්නත්කරණ වැඩසටහනට ප්‍රමුඛතාවය ලබාදීම සම්බන්ධවයි.**</u>

කොවිඩ් වසංගත තත්වය තුළ ඉතාමත් අවධානම් සහගත කටයුතු වලට සම්බන්ධ වෙමින් මෙම වසංගත තත්වයෙන් ශ්‍රී ලාංකික ජනතාව මුදවා ගැනීම සඳහා ඔබ ප්‍රමුඛ සියළුම පාර්ශවයන් සිදුකරනු ලබන කාර්ය භාර්ය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව බෙහෙවින් අගය කරන්නෙමු.

කොවිඩ් පාලනය කිරීමේදී සෞඛ්‍ය සේවයේ පහළ ශ්‍රේණියේ මෙන්ම අනිකුත් ක්ෂේත්‍ර වල සිට ඉහළ ශ්‍රේණිය දක්වා සේවක කණ්ඩායම් එකී රාජකාරි වල නිරත වන බව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිරීක්ෂනය කර ඇත.

එසේම පසුගිය දින කිහිපය තුළ කොවිඩ් - 19 තත්වය මර්ධනය කිරීම සඳහා රජය විසින් ගෙන යනු ලබන ක්‍රියාමාර්ගයක් ලෙස ඇස්ට්‍රාසෙනිකා, ස්පුට්නික් V හා සයිනොෆාම් ආදි වශයෙන් වූ විවිධ එන්නත් වර්ග හඳුන්වා දී ඇත. මෙකී එන්නත් ලබාදීමේදී වඩාත් සාධාරණ හා විනිවිද භාවයෙන් යුක්තව එම කටයුත්ත සිදු නොවන්නේ යැයි ප්‍රකාශ කරමින් සෞඛ්‍ය සේවයේ හා වෙනත් සේවා වල විවිධ සංවිධාන මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇත.

එසේ හෙයින් මෙම කටයුත්තේදී සත්‍ය වශයෙන් මෙන්ම ඍජු ලෙස කොවිඩ් ආසාදිත රෝගීන් සමඟ ගැටෙන්නා වූ හා එමඟින් ආසාදනය විය හැකි කණ්ඩායම් වෙත ප්‍රමුඛතාවය ලබාදීම සුදුසු බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

ඊ් අනුව දරනු ලබන්නා වූ තනතුරු හා වෙනත් උපකල්පිත ප්‍රමුඛතාවයන් සැලකිල්ලට භාජනය නොකරමින්, මෙම රෝගය මර්ධනය සඳහා ඍජුවම දායකත්වය සපයන කණ්ඩායම් හා එකී දායකත්වය සපයන අය සමඟ ජීවත් වන වැඩිහිටියන්ට ද, රෝගය ව්‍යාප්ත වන ප්‍රදේශ හා කණ්ඩායම් ද සැලකිල්ලටභාජනය කරමින් වඩා සාධාරණ හා යුක්ති සහගත ක්‍රමවේදයක් අනුගමනය කරන්නේ නම් බෙහෙවින්ම සාධාරණ වනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.co
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඒ සඳහා ඔබ අමාත්‍යාංශය දක්වන සැලකිල්ල මත මේ පිළිබඳව මානව හිමිකම් උල්ලංඝනය වන්නේ යැයි සිදුකරන විවේචන හා ඉල්ලීම් ද අවම කර ගත හැකි බව විශ්වාස කරමි.

එබැවින් ඒ සඳහා නියමිත ප්‍රමුඛතා ලේඛනයක් හා සුදුස ප්‍රයෝගික ක්‍රමවේදයක් සකස් කොට එය ප්‍රසිද්ධියට පත් කර 2021.06.15 දිනට පෙර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කරන්නේ නම් මැනවි.

මෙම දැන්වීම කරනු ලබන්නේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත ප්‍රකාරව බව කරුණාවෙන් සලකන්න.

ආචාර්ය ජගත් බාලසූරිය,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.